# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1851/1 - 2014 පෙබරවාරි මස 24 වැනි සඳුදා - 2014.02.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

විධාන අංක 49

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

10(1)(අ) වගන්තිය යටතේ නියමය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10(1)(අ) වගන්තිය මගින් පැවරී ඇති බලතල යටතේ කටයුතු කරමින්, මෙහි උපලේඛනයේ දක්වා ඇති භාණ්ඩ නිෂ්පාදකයින්, ආනයනකරුවන්, බෙදාහරින්නන් හා වෙළඳුන් වෙත මෙම විධානයේ පනවා ඇති කාර්ය පරිපාටිය හා අනුගතව කටයුතු කළ යුතු බවට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් මෙයින් විධාන කරනු ලැබේ :

1. අදාළ භාණ්ඩ සෑම එකකම ඇසුරුම, බහාලුම, හෝ දවටනය මත පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙතින් ලබාගත් ආරක්ෂක මුද්‍රාවක් තබා ඇත්තේ නම් විනා කිසිදු භාණ්ඩයක් නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, බෙදා හැරීම, ප්‍රවාහනය කිරීම, ගබඩා කිරීම, විකිණීම, විකිණීමට ඉදිරිපත් කිරීම හෝ කරනු නොලැබිය යුතුය.

2. භාණ්ඩවලට අදාළ සෑම නිෂ්පාදකයෙකු හෝ ආනයනකරුවකු විසින්ම, එම භාණ්ඩ වෙළෙන්දන් සහ/හෝ පාරිභෝගිකයන් වෙත බෙදා හැරීම සඳහා නිකුත් කිරීමට ප්‍රථම එම භාණ්ඩ සෑම එකකම ඇසුරුම, බහාලුම, හෝ දවටනය මත ආරක්ෂක මුද්‍රා තබා ඇති බවට සහතික විය යුතුය.

3. ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ සඳහා මෙම කාර්ය ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන්නාවූ ස්වයං ක්‍රියාකාරී උපකරණ බලයලත් සේවා සපයන්නා විසින් පමණක් නිෂ්පාදකයන්ගේ කර්මාන්තශාලා තුළ ස්ථාපනය කරනු ඇත. එම නිෂ්පාදකයන් විසින් ස්වයං ක්‍රියාකාරී උපකරණ ස්ථාපනය කිරීම සඳහා බලයලත් සේවා සපයන්නා වෙත අවශ්‍ය වන්නාවූ යටිතල පහසුකම් හා අනෙකුත් පහසුකම් සැපයිය යුතුය. නිෂ්පාදකයින් විසින් සාමාන්‍ය කාර්ය හා නඩත්තු කාල වේලාවන් තුළදී, උපකරණ ස්ථාපනය කිරීම හා උපකරණ ආශ්‍රිත සාමාන්‍ය නඩත්තු හා අලුත්වැඩියාවන් සඳහා, තම නිෂ්පාදන පහසුකම් කරා ප්‍රවේශවීමටද බලයලත් සේවා සම්පාදකයා වෙත අවසර ලබාදිය යුතුය.

4. ආනයනකරුවන් විසින්, එම භාණ්ඩ ශ්‍රී ලංකා වෙළඳපල වෙත මුදා හැරීමට ප්‍රථම, විදේශයෙහි සිටින විදේශීය නිෂ්පාදකයා විසින් හෝ ආනයනකරු විසින් රේගු ගබඩාවේදී, එම භාණ්ඩ සෑම එකකම ඇසුරුම, බහාලුම හෝ දවටනය මත ආරක්ෂක මුද්‍රා තබා ඇති බවට සහතික විය යුතුය.


1A - PG 1982— 210 (2014/02)

සැ. යු.- *අති විශෙෂ ගැසට් අංක 1850/1 කාණ්ඩය 1850/55 න් අවසන් වේ.*

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

5. භාණ්ඩ නිපදවන්නන් හෝ ආනයනකරුවන් විසින් තමාහට අවශ්‍ය ආරක්ෂක මුද්‍රා ප්‍රමාණය පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියෙන් ලබාගෙන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් නම් කරනු ලබන වෙබ් අඩවියක් මගින් එම භාණ්ඩ සෑම එකකම ඇසුරුම, බහාලුම හෝ දවටනය මත ආරක්ෂක මුද්‍රා තබා ඇති බව ප්‍රකාශයට පත්කළ යුතුය.

6. භාණ්ඩවල ඇසුරුම, බහාලුම හෝ දවටනය මත යෙදීම පිණිස ආරක්ෂක මුද්‍රා ලබාගැනීම සඳහා භාණ්ඩ නිපදවන්නන් හා ආනයනකරුවන් විසින් අනුගමනය කළයුතු කාර්ය පරිපාටිය පහත පරිදි වනු ඇත :-

(අ) භාණ්ඩ වර්ගය හා නියමිත කාලය සඳහා අවශ්‍ය ආරක්ෂක මුද්‍රා සංඛ්‍යාව නිශ්චිතව දක්වමින්, ඒ ඒ කාර්තුවේ සෑම පළමු ව්‍යාපාරික දිනයකම නිෂ්පාදකයන් හා ආනයනකරුවන් විසින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත මාස 12 ක ආරක්ෂක මුද්‍රා අයදුම් පූර්ව නිවේදනයක් ලබා දිය යුතුය ;

(ආ) නිෂ්පාදකයන් හා ආනයනකරුවන් විසින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මගින් පවත්වාගෙන යනු ලබන මධ්‍ය දත්ත පදනමකට සම්බන්ධ ආරක්ෂිත වෙබ් අන්තර් මුහුණතක් භාවිතා කරමින් ආරක්ෂක මුද්‍රා සඳහා ඇනවුම් ඉදිරිපත් කළ යුතුය. ආනයනකරුවන් සම්බන්ධයෙන් වන කල්හි, ශ්‍රී ලංකාව වෙත ආනයනය කරනු ලබන භාණ්ඩ වල විදේශීය නිෂ්පාදකයා/අපනයනකරු කවරෙක්ද යන්න ද ඇනවුමෙහි නිශ්චිතව දැක්විය යුතුය ;

(ඇ) යම් නිෂ්පාදකයකු සහ/හෝ ආනයනකරුවකු විසින් 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ විධිවිධාන හෝ ඒ යටතේ නිකුත් කර ඇති කවර වූ හෝ විධාන හෝ නියෝගයන් උල්ලංඝනය කර හෝ ඒවා පිළිපැදීමට හා ඒ අනුව කටයුතු කිරීමට අපොහොසත් වී ඇත්නම් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින්, සිය අභිමතය පරිදි, එම නිෂ්පාදකයන් හා/හෝ ආනයනකරුවන් විසින් දී ඇති ඇනවුම් ප්‍රතික්ෂේප කරනු ඇත ;

(ඈ) මෙම විධානයේ ප්‍රකාර භාණ්ඩ නිපදවන්නන් හා ආනයනකරුවන් වෙත පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් සපයනු පිණිස ආරක්ෂක මුද්‍රා නිර්මාණය කිරීමෙහි හා සම්පාදනය කිරීමෙහි ලා බලයලත් සේවා සම්පාදකයා විසින් සපයනු ලබන සේවා සඳහා, එක් එක් ආරක්ෂක මුද්‍රාවක් වෙනුවෙන් නිෂ්පාදකයන් හා ආනයනකරුවන් විසින් බලයලත් සේවා සම්පාදකයා වෙත පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් පනවා ඇති ගාස්තුවක් ගෙවිය යුතු ය ;

(ඉ) නිෂ්පාදකයකු හෝ ආනයනකරුවකු විසින් කර ඇති ඕනෑම ඇනවුමක් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් අනුමත කරනු ලැබීමෙන් පසු, බලයලත් සේවා සම්පාදකයා විසින් එකී ඇනවුම් අනුමැතියෙන් දින 3 ක් ඉක්මවීමට පෙර ඉහත (ඈ) හි දක්වා ඇති ගාස්තු වෙනුවෙන් නිෂ්පාදකයාට හෝ ආනයනකරුට ඉන්වොයිසියක් නිකුත් කළ යුතුය ;

(ඊ) එම ඉන්වොයිසිය සම්පූර්ණයෙන් පියවීමෙන් පසු, ඇනවුමෙහි නිශ්චිතව දක්වා ඇති ආරක්ෂක මුද්‍රා රැගෙන යා හැකි බව බලයලත් සේවා සම්පාදකයා විසින් අදාළවන පරිදි නිෂ්පාදකයාට හෝ ආනයනකරුට දැනුම්දිය යුතු අතර ඉන්පසු, අදාළවන පරිදි, නිෂ්පාදකයාට හෝ ආනයනකරුට එම ආරක්ෂක මුද්‍රා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියෙන් රැගෙන යා හැක.

7. මෙම විධානයෙහි කටයුතු සඳහා,

(i) "භාණ්ඩ" යන්නෙන් මෙම විධානයෙහි උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ අදහස් කෙරෙනු ඇත ;

(ii) "බලයලත් සේවා සපයන්නා" යන්නෙන් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් භාණ්ඩ නිෂ්පාදකයන් හා ආනයනකරුවන් වෙත සම්පාදනය කරනු ලබන ආරක්ෂක මුද්‍රා නිමැවුම සහ මෙම ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සපයනු පිණිස මෙම විධානයට අනුකූලව නිෂ්පාදකයන් හා ආනයනකරුවන් වෙත අදාළ දෘඩාංග, මෘදුකාංග හා අනෙකුත් ස්වයංක්‍රියාකාරී උපකරණ සැපයීම වෙනුවෙන් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ලිඛිතව බලය පවරා ඇති ඕනෑම සේවා සම්පාදකයෙකු අදහස් කෙරෙනු ඇත ;

(iii) "විදේශීය නිෂ්පාදකයා/අපනයනකරු" යන්නෙන් ශ්‍රී ලංකාව තුළට ආනයනය කරනු ලබන භාණ්ඩ සම්බන්ධව ශ්‍රී ලංකාවෙන් පිටත සිටින, අදාළවන පරිදි, නිෂ්පාදකයා හෝ අපනයනකරු අදහස් කෙරෙනු ඇත ;

(iv) "ආනයනකරු" යන්නෙන් 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ අර්ථ සීමාව තුළ විකිණීම හෝ සැපයුම් කටයුතු සඳහා භාණ්ඩ ආනයනය කරන වෙළෙන්දෙකු අදහස් කෙරෙනු ඇත ;

(v) "කාර්තුව" යන්නෙන් පිළිවෙලින් ලිත් වර්ෂයක ජනවාරි 1 වැනි දිනයෙන්, අප්‍රේල් මස 1 වැනි දිනයෙන්, ජූලි 1 වැනි දිනයෙන් සහ ඔක්තෝබර් 1 වැනි දිනයෙන් ආරම්භ වන ඕනෑම මාස තුනක (3) කාල පරිච්ඡේදයක් අදහස් කෙරෙනු ඇත.

මෙම විධානය 2014 අගෝස්තු මස පළමුවෙනි දින සිට ක්‍රියාත්මක වනු ඇත.

## උපලේඛනය

*මෙම විධානයට අනුකූලව ආරක්ෂක මුද්‍රා තැබිය යුතුවන භාණ්ඩ*

1. සිසිල් බීම ;
2. බෝතල් කළ ජලය/බෝතල් කළ ඛනිජ ජලය ;
3. සන්නම්ගත ආහාර සකස් කිරීමට යොදාගන්නා තෙල් ;
4. දන්තාලේප ;
5. සියළුම වර්ගවල සබන් ;
6. ෂැම්පු ;
7. තීන්ත ;
8. විදුලි ස්වීච්, කෙවෙනි, පරිපථ කඩනයන්.

පාර්භෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

රූමි මර්සූක්,
සභාපති.

2014 පෙබරවාරි මස 24 වැනි දින,
කොළඹ දී ය.

03 - 250